# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 145/[redacted] 1975 ජනවාරි මස 03 වැනි සිකුරාද—1975.01.03

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන්ම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 2 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ජන්ද ආඥපනත යටතේ දන්වීම් ... | — | විවිධ දන්වීම ... ... ... | 2 |


සැ. යු.—කොළඹ පහයන නැව් තටාකය හා ජේටන්ව් ලිස්සුම් මාලා පිළිබඳ ආඥපනත ඉවත් කිරීම් පනත් කෙටුම්පත; ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත සහ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 1974 දෙසැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

### විශේෂ කොමසාරිස් කාර්යාලය—ධර්ගා නගරය

සුළු නගර සභා ආඥපනත

**1974 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) වගන්තිය යටතේ ධර්ගා නගරයේ විශේෂ කොමසාරිස් විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව ධර්ගා නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දෙක බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1974 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. ව්. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1974.12.20 වැනි දින,
කොළඹ දී ය.

1–139—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### පොල්ගහවෙල සුළු නගර සභාව

සුළු නගර සභා ආඥපනත

**1975 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ පොල්ගහවෙල සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව පොල්ගහවෙල නගරය තුළ පිහිටා ඇති (කුඹුරු හැර) සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින යන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමැතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. ව්. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1974.12.13 දින,
කොළඹ දී ය.

1–114—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

F1—බ 71605-5,891 (74/12)

### වැලිමඩ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1975 වර්ෂය සඳහා වූ විශේෂ ජල බද්ද

(256 වැනි අධිකාරය වූන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ වැලිමඩ සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මඟින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව වැලිමඩ නගරය තුළ පිහිටා ඇති සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දෙක බැගින් වූ විශේෂ ජල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1974 දෙසැම්බර් 4 දින,
කොළඹ දීය.

1-1003—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥාපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් නන්දසේන බඹරවානගේ වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභාවේ අංක 7 දරණ කොට්ඨාශයේ නියෝජිත වර්සහෙන් නැදීගේ නාපලේගෙදර ජස්ටින් සොයිසා මහතා ගම්සභාවට දැන්වීමක් නොකර පිළිවෙලින් ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභාවේ අංක 7 දරණ කොට්ඨාශයේ නියෝජිත වර්සහෙන් නැදිගේ නාපලේගෙදර ජස්ටින් සොයිසා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

න. බඹරවානගේ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1974 ක්වූ දෙසැම්බර් මස 19 දින,
නුවරඑළිය, පළාත් පාලන කාර්යාලයේ දීය.

1-54—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

### කොට්කාවත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන සහ 156 වන වගන්තිය යටතේ කොට්කාවත්ත සුළු නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1974 දෙසැම්බර් 16 වැනි දින, කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධි විධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැළසුම් පරීක්ෂාකිරීම හා සළාකා බැලීම සම්බන්ධයෙන්, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත ප්‍රමාණයන් අනුව තීරණය කරන ලද ගාස්තුවක් ගෙවිය යුතුය.

2. (i) 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව, කොට්කාවත්ත සුළු නගර සභාවේ සභාපතිගෙන් ගෙවීම් ඉල්ලුම් ලැබී දින හතක් ඇතුළත අනුමැතිය හෝ අභිමතය සඳහා ඉල්ලුම් කළ තැනැත්තා විසින් ගෙවිය යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ පෙරාතුව වූ ඡේදයෙහි නියම කොට ඇති කාලය තුළ එබඳු ගාස්තුව ගෙවීමට අපොහොසත් වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු වීමෙන් රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත්විය යුතුය.

3. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවන තුරු කිසිම සැළසුමක් පරීක්ෂා කිරීම හෝ සළකා බැලීම නොකළ යුතුය.

### උපලේඛනය

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වලට අතිරේකව බිම් ඉඩක් අවශ්‍යවන වෙනස් කිරීම සඳහා වූ සැලසුම්:—

| | පදිංචිය සඳහා වූ ගොඩනැගිලි | | අන්‍ය ගොඩනැගිලි වෙනුවෙන් |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 500 ට වැඩි නොවනකල්හි | ගාස්තුවෙන් නිදහස් | | 10 0 |
| (ආ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 500 ට වැඩි නමුත් වර්ග අඩි 1,000ට නොවැඩි කල්හි | 10 0 | ... | 15 0 |
| (ඇ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 1,000ට වැඩි නමුත් වර්ග අඩි 1,500ට නොවැඩි කල්හි | 15 0 | ... | 20 0 |
| (ඈ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 1,500කට වැඩි නමුත් වර්ග අඩි 2,000 කට නොවැඩි කල්හි ... ... | 20 0 | ... | 25 0 |
| (ඉ) වර්ග අඩි 2,000 කට වැඩි වන වර්ග අඩි 100 ක් වන සෑම අතිරේක ඒකකයක් හෝ ඉන් කොටසක් සඳහා ... | 2 50 | ... | 5 0 |
| 2. අළුතෙන් සැලසුම් ඉදිරිපත් නොකොට අනුමැතිය අළුත්කර ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ... | 2 50 | ... | 5 0 |

මෙම උපලේඛනයෙහි ' බිම් ඉඩ ' යන්නෙහි බිම් මහලෙහි ඉඩ හෝ වෙනත් යම් මහලක ඉඩ අදහස් වේ.

1-82—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### දෙහිඕවිට සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි සහ 163 වැනි වගන්ති යටතේ දෙහිඕවිට සුළු නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් එහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු 1975 ජනවාරි මස 01 වෙනි දින සිට බලපවත්වන සේ පනවා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1972 දෙසැම්බර් මස 12 වෙනි දින අංක 36 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය 1975 ජනවාරි මස 01 වෙනි දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ.

පියතිස්ස රණසිංහ,
පරිපාලන නිලධාරී,
දෙහිඕවිට සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 19 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්යාලයේදීය.

## උපල්බනය

| බලපත්‍රයේ ස්වභාවය සහ පැනවීමට ඇති බලය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| (I) පළාත් පාලන ආයතන (සම්මුත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ පිළියෙල කරන ලදුව මෙම සභාව මගින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ— | | |
| III වැනි කාණ්ඩය යටතේ— | | |
| (1) බේකරියක් පරත්වාගෙන යාම සඳහා | 50 | 0 |
| IV වැනි කාණ්ඩය යටතේ— | | |
| (I) බත් කඩයක්, රෙස්ටුරන්ට් ශාලාවක් හෝ තේ කෝපි කඩයක් පවත්වාගෙනයාම සඳහා— | | |
| (අ) දෙහිඕවිට නගරයේ ඇහැලියගොඩ පාර හන්දියේ සිට දූරණියගල හන්දිය දක්වා ඇති ගිනිගත්හේන ප්‍රසිද්ධ පාර දෙපස හා කල්දූව නගරයේ කල්දූව-ගුරුගල්ල පාරේ වරිපනම් අංක 49 සීමාව දක්වා සහ අවිස්සාවේල්ල-කෑගල්ල පාරේ අවිස්සාවේල්ල ප්‍රසිද්ධ පාලම සීමාව සිට කල්දූව කඩමණ්ඩියේ කෙළවර දක්වා පාර දෙපස පිහිටි විට | 25 | 0 |
| (ආ) එම සීමාවලින් බාහිර ස්ථානයක පිහිටි විට | 15 | 0 |
| V වෙනි කාණ්ඩය යටතේ— | | |
| (1) හෝටලයක් පවත්වාගෙන යාම | 250 | 0 |
| VI වෙනි කාණ්ඩය යටතේ— | | |
| (1) නවාතැන් දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 | 0 |
| VII වෙනි කාණ්ඩයේ I වන කොටස යටතේ— | | |
| (1) ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම | 15 | 0 |
| (2) ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම | 25 | 0 |
| (3) දූව ගබඩාවක් පවත්වාගෙන යාම | 50 | 0 |
| (4) දර ගබඩාවක් පවත්වා ගෙන යාම | 10 | 0 |
| (5) යන්ත්‍රොපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (6) තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුනු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 100 | 0 |
| (7) හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම | 20 | 0 |
| (8) බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (9) පොල්කටු ගබඩාකර තබා ගැනීම | 10 | 0 |
| (10) පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර ගබඩාකර තබා ගැනීම | 10 | 0 |
| (11) මැශු ඇඳුම් නිෂ්පාදනය | 10 | 0 |
| (12) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 50 | 0 |
| VIIවන කාණ්ඩයේ II වන කොටස යටතේ— | | |
| (1) හම් ගබඩාකර තබා ගැනීම (අ) එළු හම් | 25 | 0 |
| (ආ) හරක හම් | 50 | 0 |
| (2) කුකුලන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් හලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (3) බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහසකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 25 | 0 |
| (4) රබර් නිෂ්පාදනය හෝ ගබඩාකර තබා ගැනීම— | | |
| (අ) ෂීට් රබර් හෝ ක්‍රෙප් රබර් සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 | 0 |
| (ආ) ෂීට් රබර් සාදන හෝ වේලන ස්ථානයක් පවත්වාගෙන යාම | 25 | 0 |
| (ඇ) ෂීට් රබර් හෝ ක්‍රෙප් රබර් ගබඩා කර තබා ගැනීම | 25 | 0 |
| (5) (අ) තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර වර්ග ගබඩාකර තබා ගැනීම | 100 | 0 |
| (ආ) සිල්ලර වශයෙන් ආහාර ද්‍රව්‍ය විකිණීම | 20 | 0 |
| (6) කරවල, ලුනුමාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 25 | 0 |
| (7) සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 25 | 0 |
| (8) සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (9) පුන්නක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 10 | 0 |
| (10) අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම | 10 | 0 |
| (11) ලෝහමය සුන්බුන් ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| (12) ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම | 50 | 0 |
| (13) වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (14) පින්තාරු තීන්ත වර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම | 25 | 0 |
| (15) යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංස හෝග කෙටීම | 35 | 0 |
| (16) ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගන යාම | 10 | 0 |
| (17) ඡායා රූපශාලාවක් පවත්වා ගෙන යාම | 50 | 0 |
| (18) මැණික් ගල් කැපීම හා ඔප දැමීම | 25 | 0 |
| (19) දුම්කොල සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 20 | 0 |
| VII කාණ්ඩයේ III වන කොටස යටතේ— | | |
| (1) ඩ්‍රයික්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වා ගෙනයාම | 50 | 0 |
| (2) රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වා ගෙන යාම | 50 | 0 |
| (3) හොණ්ඩර 3ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| (4) වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වා ගෙනයාම | 15 | 0 |
| (5) මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වා ගෙන යාම | 75 | 0 |
| (6) බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 10 | 0 |
| (7) පැට්‍රල්, ඩීසල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 100 | 0 |
| (8) පැට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 25 | 0 |

| බලපත්‍රයේ ස්වභාවය සහ පැනවීමට ඇති බලය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| (9) කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම් හෝ ගබඩා කර තබා ගැනීම ... ... ... | 15 | 0 |
| (10) ජී. අයි. බාල්දි නිපදවීම ... ... ... ... ... | 25 | 0 |
| (11) විදුලි කර්මාන්ත වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත් වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යාම ... ... ... ... | 50 | 0 |
| **X** වන බාණ්ඩය යටතේ— | | |
| (1) කිරි පට්ටියක් පවත්වාගෙන යාම— | | |
| (අ) එලදෙනුන් 1 සිට 5 දක්වා ... ... ... ... ... | 10 | 0 |
| (ආ) එලදෙනුන් 5 සිට 10 දක්වා ... ... ... ... ... | 50 | 0 |
| (ඇ) එලදෙනුන් 10ට වැඩි විට ... ... ... ... ... | 100 | 0 |
| (2) ලියාපදිංචි කිරි විකුනන්නකුගේ කාඩ් පතක් සඳහා (මසකට රු. 2.50) ... ... ... | 30 | 0 |
| **XI** වැනි බාණ්ඩය යටතේ— | | |
| (1) බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා ... ... ... ... | 30 | 0 |
| **XII** වන බාණ්ඩය යටතේ— | | |
| (1) මාලු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 25 | 0 |
| (2) වෑන් රියකින් මාලු විකිණීම සඳහා ... ... ... ... ... | 150 | 0 |
| (3) බයිසිකලයකින් මාලු විකිණීම සඳහා ... ... ... ... ... | 30 | 0 |
| **XIII** වැනි බාණ්ඩය යටතේ— | | |
| (1) හරක් මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 50 | 0 |
| (2) එළුමස් කඩයක් පවත්වාගෙන යාම සඳහා ... ... ... ... | 25 | 0 |
| (3) කුකුල් මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 15 | 0 |
| 1972.04.21 වැනි දින අංක 15,007 දින ගැසට් පත්‍රයේ පළකරන ලද මෙම සභාව පනවා ඇති අතුරු ව්‍යවස්ථා යටතේ— | | |
| (අ) එළවළු කඩයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 15 | 0 |
| (ආ) පළතුරු කඩයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 15 | 0 |
| (ඇ) එළවළු හා පළතුරු කඩයක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 25 | 0 |
| 1972.04.28 වෙනි දින අංක 15,008 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද මෙම සභාව මගින් පනවා ඇති අතුරු ව්‍යවස්ථා යටතේ— | | |
| (ආ) ලොන්ඩරියක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... ... | 25 | 0 |

1-167—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## කොහොන්සිය පත්තුව ගම්සභාව

### ගෝඝාතන ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බැවින් ඒ අනුව මේ අයට බලපත්‍ර නිකුත් කිරීම ගැන කොහොන්සිය පත්තුව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥපනතේ (272 වැනි අධිකාරිය) 7(2) වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. එම්. ඒ. සමූන්, දෙහිපිටිය, වරකාමුර ... | ... හරක් මස් | ... පොට්ටයාගේ වත්ත |

1974 දෙසැම්බර් 23 වැනි දින,
මාතලේ, කොහොන්සිය පත්තුව ගම්සභා කාර්යාලයේදීය.

ඩබ්. ජී. සරණදස,
කොහොන්සිය පත්තුව ගම්සභාවේ සභාපතිතැන.

1-176—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහපොතාන කෝරලේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව මහපොතාන කෝරලේ ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කාරණයක් සඳහා යැයි දක්වෙන ලියවිල්ලක පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසැට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වැනි අධිකාරයේ 2 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇම්. එස්. අහමඩ්, වැලිගොල්ලෑව, ගලෙන්බිඳුනුවැව | මහපොතාන කෝරලේ කෝන්වැව නගරයේ ... | ගවමස් |

1974 දෙසැම්බර් මස 12 වෙනි දින,
මහපොතාන කෝරලේ ගම්සභාකාර්යාලයේ දීය,
කෝන්වැව–මහපොතාන.

කේ. බී. තිලකරත්න,
ගම්සභාපති,
මහපොතාන කෝරලේ ගම්සභාව.

1-77—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### හෝමාගම සුළු නගර සභාව

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (පරිච්ඡේදය 477)**

**1975 වර්ෂය සඳහා සුනඛ බද්ද**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) අංක 4 වැනි වගන්තිය යටතේ, මෙම සුළු නගර සභා බල මණ්ඩලය තුළ තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1 ක්ද, සෑම බැල්ලියක වෙනුවෙන් රු. 2 ක්ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට මෙන්ම 1975 වර්ෂයටද, පනවා ඇති බවද, එකී ගාස්තු 1975 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද, හෝමාගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විල්ෆ්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 24 වැනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදීය.

1-175/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### හෝමාගම සුළු නගර සභාව

**1975 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි පරිච්ඡේදයේ) අංක 161 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි නම් කරන ලද රථවාහන හා සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන බදු 1974 වර්ෂයට මෙන්ම 1975 වර්ෂයටද, පනවා ඇති බවත්,

2. සඳහන් ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ, එකී බදු 1975 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, හෝමාගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විල්ෆ්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 24 වැනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදීය.

**උපලේඛනය**

මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ඕනෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත්, රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක් :—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා පාවිච්චි කෙරේ නම්, ... ... | 1 | 0 |
| (ඇ) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්තයකට ... ... | 4 | 0 |
| (ඈ) ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 2 | 50 |
| (ඉ) ඕනෑම අත්කරත්තයකට ... ... | 2 | 50 |

1-175/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

**1975 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162 වැනි වගන්තිය යටතේ රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් 1974 වර්ෂයේ බලපැවැත්වෙමින් තිබෙන පරිදිම 1975 වර්ෂයට අය කිරීමට මා විසින් පනවා තිබෙන බවද, සඳහන් ආඥාපනතේ 163(3) වගන්තිය යටතේ එකී බද්ද 1975 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උප ලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, බයිසිකල්, ලොරි, මෝටර් පාපැදි හෝ කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, බයිසිකල් හෝ ට්‍රයිසිකල් පාපැදි හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | 5 | 0 |

සෑම බයිසිකලයක් රෝද තුනේ බයිසිකලයක් නම්—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 0 |
| (ඇ) ඕනෑම අන්දමක කරත්තයක් වෙනුවෙන් ... | 1 | 0 |
| (ඈ) ඕනෑම අන්දමක අත් කරත්තයක් වෙනුවෙන් ... | 4 | 0 |
| (ඉ) ඕනෑම අන්දමක ජින් රික්ෂෝ රථයක් වෙනුවෙන් ... | 2 | 50 |
| (ඊ) ඕනෑම අශ්වයෙක්, අශ්ව පෝනියෙක් හෝ මියුලෙක් ... | 4 | 0 |

ඩබ්ලිව්. එච්. ඩබ්ලිව්. සොයිසා,
විශේෂ කොමසාරිස්, අම්බලන්ගොඩ නගරය.

1974 දෙසැම්බර් මස 18 වන දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-191/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

**1975 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වැනි වගන්තියේ ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ හබාගත් සෑම බල්ලෙකුට හා බැල්ලියක වෙනුවෙන් 1974 වර්ෂයේ අය කරන ලද ගාස්තුව වන රුපියල් එකයි ශත පනහ (රු. 1.50) 1975 වර්ෂයට ද අය කිරීමට පනවා ඇති බව ද එකී ගාස්තු 1975 අප්‍රියෙල් මස 1 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ඩබ්ලිව්. සොයිසා,
විශේෂ කොමසාරිස්, අම්බලන්ගොඩ නගරය.

1974 දෙසැම්බර් මස 18 වෙනි දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-191/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

**පළාත් ආණ්ඩු සභා ආඥාපනත—255 වන අධිකාරය**

(255 වන අධිකාරය වන) පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ, 162, 164 වන වගන්ති යටතේ, අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් විසින් මේ නිවේදනයට යා කර ඇති උප ලේඛනයෙහි විස්තර කෙරෙන බලපත්‍ර සම්බන්ධයෙන් 1975 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ඩබ්ලිව්. සොයිසා,
විශේෂ කොමසාරිස්, අම්බලන්ගොඩ නගරය.

1974 නොවැම්බර් මස 26 වන දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

**උපලේඛනය**

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තු රු. | ශ. |
|---|---|---|
| (1) කබුක්, බොරළු හෝ කළුගල් කැනීම ... ... | 50 | 0 |
| (2) කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම ... | 50 | 0 |
| (3) සිසිල්බීම නිෂ්පාදනය ... ... ... | 100 | 0 |
| (4) ග්‍රෝස් 1කට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම ... ... ... | 50 | 0 |
| (5) අයිස් නිපදවීම ... ... ... | 100 | 0 |
| (6) කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම ... ... ... | 25 | 0 |

### බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

#### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම් සඳහන් අයවලුන් එහි සඳහන් ස්ථානවල 1975 වර්ෂයේ මස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝ ඝාතක ආඥාපණතේ (272 වන පරිච්ඡේදයේ) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රයන් නිකුත් කිරීම ගැන බණ්ඩාරවෙල නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

#### උපලේඛණය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. එම්. මොහමඩ් තාහ මහතා, 10, පූනාගල පාර, බණ්ඩාරවෙල ... | ... ගව මස් ... | අංක 19, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |
| 2. ඒ. වයි. එම්. කාන් මහතා, අංක 20, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල | ... ගව මස් ... | අංක 20, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |
| 3. කේ. කාලිදීන් මහතා, අංක 9, මොහිදීන් ගාර්ඩන්, බණ්ඩාරවෙල ... | ... එළු මස් .... | අංක 21, ප්‍රසිද්ධ වෙළඳ සැල, බණ්ඩාරවෙල |

ආර්. සැන්ට්. එස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1974 දෙසැම්බර් මස 20 දින,
බණ්ඩාරවෙල, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–198/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරිය) 17 (I) දරණ වගන්තියෙන් පැවරී තිබෙන බලය ප්‍රකාර, නියමිත අධිකාරී තැනවූ බණ්ඩාරවෙල නගරයේ විශේෂ කොමසාරිස් පහත දක්වෙන උපලේඛණයේ සඳහන් දිනයන්හිදී බණ්ඩාරවෙල නගර සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබේ.

#### උපලේඛණය

| | | |
|---|---|---|
| 1975 ජනවාරි 27 | — | දුරුතු මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 පෙබරවාරි 25 | — | නවම් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 මාර්තු 26 | — | මැදින් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 මාර්තු 28 | — | මහ සිකුරාදා දිනය |
| 1975 අප්‍රේල් 14 | — | සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය |
| 1975 අප්‍රේල් 25 | — | බක් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 මැයි 22 | — | ජනරජ දිනය |
| 1975 මැයි 24 | — | වෙසක් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 මැයි 25 | — | වෙසක් මස පුර පසළොස්වක් පෝය දිනට පසු දිනය |
| 1975 ජූනි 23 | — | පොසොන් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 ජූලි 22 | — | ඇසළ මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 අගෝස්තු 21 | — | නිකිණි මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 සැප්තැම්බර් 19 | — | බිනර මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 සැප්තැම්බර් 26 | — | බණ්ඩාරනායක අනුස්මරණ දිනය |
| 1975 ඔක්තෝබර් 04 | — | ලෝක සත්ව දිනය |
| 1975 ඔක්තෝබර් 19 | — | වප් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 නොවැම්බර් 18 | — | ඉල් මස පුර පසළොස්වක් පෝය දිනය |
| 1975 දෙසැම්බර් 18 | — | උඳුවප් මස පුර පසළොස්වක් පෝය දිනය |

ආර්. සැන්ට්. එස්. පෙරේරා
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1974 දෙසැම්බර් මස 19 දින,
බණ්ඩාරවෙල, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–198/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ගම් සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන හෙට්ටිපොල ගම් සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් ඒ කුමණ කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

1974 දෙසැම්බර් මස 24 දින
හෙට්ටිපොල ගම්සභා කායර්‍යාලයේදී.

ඇම්. ඇල්. යූ. අහමදු ලෙබ්බෙ,
හෙට්ටිපොල ගම්සභාවේ සභාපති.

#### උප ලේඛණය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| ඇස්. එල්. සෙයියදු ඉබ්‍රාහිම්, පොල්ගවෙල, අතුන්ගහකොටුව | ... එළහරක් මස් | ... හෙට්ටිපොල වෙළඳපොල |
| එම්. ඇස්. සාදිකින් | ... එළු මස් | ... හෙට්ටිපොල වෙළඳපොල |
| ඒ. ඇම්. ඉලේයාස් | ... එළහරක් මස් | ... බංඩාරකොස්වත්ත, කොස්ගහමුල වත්ත |

1—140—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### හැඳල සුළු නගර සභාව

#### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛණයේ නම් සඳහන්, අයවලුන් විසින් මෙහි දක්වෙන ස්ථානවල 1975 වර්ෂයට මස්කඩ පවත්වා ගෙනයාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන, හැඳල සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සහිතව සිටිනසේ සකස් කොට, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 7 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් විස්තරය | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇඩ්වින් ජයරත්න, 69/1, හේකිත්ත, වත්තල | එළ හරක්මස්, එළුමස්, ඌරුමස් | හැඳල වෙල්ල |
| 2. | ආර්. ඇන්ටනි, 132, වැලිඅමුණ පාර, තිඹිරිගස්යාය | එම | නායකකන්ද |
| 3. | ඇම්. ඇස්. පෙරේරා, 69/1, හේකිත්ත, වත්තල | එම | ඇලකන්ද හන්දිය |
| 4. | ඇල්. ඩී. නිකුලස්, මරදාන පාර, තිඹිරිගස්යාය | එම | ඇලකන්ද රා තැබෑරුම |
| 5. | එච්. ජී. වෛතපාල, 24/2, මරදාන පාර, තිඹිරිගස්යාය | එම | පල්ලියවත්ත පාලම අසල |
| 6. | ආර්. ඇඩ්වින්, 52, වැලිඅමුණ පාර, තිඹිරිගස්යාය | එම | හේකිත්ත හන්දිය අසල |

ඒ. ඩී. විල්බට්,
සභාපති,
හැඳල සුළු නගර සභාව.

1974.12.18 දින,
හැඳල සුළු නගර සභා කාර්යාලයේදී.

1–126—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### කහවත්ත නගරය

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත සඳහන් උපලේඛණයේ නම් සඳහන් අය එහි සඳහන් කොට ඇති ස්ථානයේ 1975 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කොට තිබෙන බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කහවත්ත නගර සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලකින් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|---|
| 1. | ඇම්. ඒ. ඇස්. කාටුබාවා, 16, ඇතුල් රවුම් පාර, රත්නපුරය. | කහවත්ත පොදු වෙළඳ පොළේ එළ හරක් මස් කඩය |
| 2. | ඩී. ඇස්. රාජානන්දන්, 16, ඇතුල් රවුම් පාර, රත්නපුරය | කහවත්ත පොදු වෙළඳ පොළේ එළු මස් කඩය |

ඒ. ඇල්. අමරසිංහ,
කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස්.

1974.12.20 වන දින,
කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් කායර්‍යාලයේ දීය.

1–128—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### කෑගල්ල දිස්ත්‍රික්කයේ අළුත්නුවර ගම් සභාව

#### ගෝ ඝාතක ආඥාපණත

මෙහි පහත උපලේඛණයේ සඳහන් අය විසින් 1975 වර්ෂය තුළ ගෝ ඝාතක ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බැවින්, එම අයට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ අළුත්නුවර ගම්සභා සීමාව තුළ පදිංචි යම් අයකු විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ නම් සිය විරුද්ධතාවය සඳහා ඇති කරුණු සඳහන් කොට පිටපත් දෙකකින් යුක්තවූ ලියවිල්ලකින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට දින 14 ක් ඇතුළත දී සිය විරුද්ධතාවය ඉදිරිපත් කළ යුතු බැව්, ගෝ ඝාතක ආඥාපණතේ (272 අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | අයදුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | එම්. ආර්. එම්. මන්සූර්, කොටගහමුල කඩේ, තල්ගස්පිටිය, අරණායක | ඔලාන, බුළුවේ හිටිනා වත්ත | ගව මස් |
| 2. | එම්. එල්. එම්. කාසිම්, කහටඅංග, දෙහිගම, මුරුතලාව | උයන්වත්ත, හෝලාඋල්ලතැන්න වත්ත | ගව මස් |

පී. ආර්. රත්නායක,
සභාපති,
අළුත්නුවර ගම්සභාව.

අළුත්නුවර ගම්සභා කාර්යාලයය,
අල්පිටිය, පරණගම,
1974.12.23 වෙනි දින දීය.

1–206—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

## කන්තලේ ගම් සභාව

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින් 1975 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බල පත්‍ර ඉල්ලුම්කර සිටින හෙයින් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කන්තලේ ගම්සභා ප්‍රදේශය තුල පදිංචි කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ ආඥාපණතින් සංශොධිත අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. කිරිබණ්ඩා,
කන්තලේ ගම් සභාපති.

1974 දෙසැම්බර් මස 18 දින,
කන්තලේ ගම් සභාවේ දීය.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
| --- | --- | --- |
| ඇම්. එච්. ඒ. රෂාක්, අංක 154, යුනිට් 2, ජේරාරු–කන්තලේ ... ... ... | හරක් මස් ... | අංක 86 දරණ වත්ත |

1–1068—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## ගොකරැල්ල ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වන උපලේඛණයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම 1975 වර්ෂය සඳහා බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව ගොකරැල්ල ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, තමා එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් එවීමට බලය තිබෙන බවත්, එකී ලියවිල්ල මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස්ථානය | වෙළඳාම |
| --- | --- | --- | --- |
| 1. | ඇම්. එච්. ඇම්. සාඩිලින්, ෂම් ෂම් ස්ටෝර්ස්, දඹුලු පාර, මැල්සිරිපුර ... | මැල්සිරිපුර අංක 303 දරණ ගොඩනැගිල්ලේ ... | එළ හරක් මස් |
| 2. | එස්. එම්. බී. මොහිදීන්, අංක 8, බෝධිරාජ මාවත, කුරුණෑගල ... | ගොකරැල්ල ගම්සභාවට අයිති සිකුරාදා වෙළඳාම් පොලේ කඩ කාමරය | එළ හරක් මස් |

ඩී. එම්. ටී. බී. දිසානායක,
පාලන නිළධාරී,
ගොකරැල්ල ගම් සභාව.

1974 දෙසැම්බර් මස 11 වැනි දින දීය
ගොකරැල්ල ගම් සභා කාර්යාලයය,
ගොකරැල්ල.

1–201—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## කුලියාපිටිය නගර සභාව

### 1975 වර්ෂයේ වරිපනම් ලේඛණය

කුලියාපිටිය නගර සභාවේ වරිපනම් ලේඛණය 1975 වර්ෂය සඳහා සූදානම් කර ඇති බවත්; එය කාර්යාල වේලාවන් තුලදී බදු ගෙවන්නන්ට පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇති බවත්, 255 වැනි අධිකාරය වන නගර සභා ආඥා පනතේ 166 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 235 වෙනි වගන්තියේ 1 සහ 2 වැනි උප වගන්ති අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කිරිබණ්ඩා සත්කුමාර,
කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1974 දෙසැම්බර් මස 23 දින,
කුලියාපිටිය විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–204—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### නගර සභා ආඥාපනත

### 1975 වර්ෂය සඳහා දේපල වරිපනම් බද්ද

(255 අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය යටතේ ගතවී ගිය 1974 වර්ෂයට බලපවත්වන ලද දේපල බදු 1975 වර්ෂයට ද, එලෙසම පැනවීමට මාතර නගරය පාලනය කරවන විශේෂ කොමසාරිස් තීරණය කර ඇත.

එම තීරණය ප්‍රකාර මෙම නගර සීමාව තුළ පිහිටි කුඹුරු හැර සෙසු සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට 23 බැගින් වූ දේපල වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන පරිදි මාතර නගරයේ විශේෂ කොමසාරිස් විසින් 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය.

1975 දෙසැම්බර් මස 18 වැනි දින,
මාතර නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

1–43—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව

### 1974 වර්ෂය සඳහා අංක 1 දරණ පරිපූරක අය-වැය

ලංකා ව්‍යවස්ථාපිත අණපනත්හි (1956 සංශෝධිත මුද්‍රණය) 214 (2) (ආ) වගන්තිය (පරිච්ඡේද 252) ප්‍රකාර, 1974 වර්ෂය සඳහා වූ අංක 1 දරණ පරිපූරක අය-වැය 1974 වර්ෂයේ දෙසැම්බර් 27 වන දින සිට දින 7 ක් දක්වා, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී කාර්යාලයීය වේලාවන් ඇතුළත මහජනයා විසින් පරීක්ෂාකර බැලීම සඳහා විවෘතව තබන බැව් මෙයින් දන්වා සිටිමි.

පී. සේනාධීර,
නගරාධිපති,
දෙහිවල-ගල්කිස්ස.

1974 දෙසැම්බර් මස 6 වැනි දින,
දෙහිවල මහා නගර සභා කාර්යාලයේ දීය.

1–55—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත**

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභාව විසින් සම්මතකරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

යෝජනාව

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ 1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, ජාතික රාජ්‍ය සභාව විසින් 1973. 04. 05 වැනි දින අනුමතකරන ලද බව 1973. 06. 29 වැනි දින අංක 66 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 වැනි කාණ්ඩය වූ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

කේ. පී. ජයසේන,
සභාපති,
වැල්ලව ගම්සභාව

1974 දෙසැම්බර් 20 වැනි දින,
වැල්ලව ගම්සභා කාර්යාලය,
මරලුවාව, කුරුණෑගල.

1—51—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**පයියාගල් සහ මග්ගොන් බද්ද ගම ප්‍රදේශය**

මස් පිණිස සතුන් මරනන් පිළිබඳව ආඥපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානවල 1975 වර්ෂයට මස්කඩවල මස් වෙළඳාම පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන පයියාගල් සහ මග්ගොන් බද්ද ගම ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එය කුමන කරුණක් නිසා ද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වෙනි අධිකාරය) අංක 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මස් කඩ පවත්වන ස්ථානය | වෙළඳාමේ විස්තරය |
|---|---|---|
| (1) ඇස්. ඒ. ජී. හමීඩ් මහතා, නො. 10, ද සිල්වා වීදිය, කළුතර දකුණ, කළුතර | මග්ගොන හරක් මස් කඩය ... | හරක් මස් විකිණීම |
| (2) ඇස්. ඒ. ජී. හමීඩ් මහතා, නො. 10, ද සිල්වා වීදිය, කළුතර දකුණ කළුතර | මහා පයියාගල හරක් මස් කඩය ... | හරක් මස් විකිණීම |
| (3) ඇස්. ඒ. ජී. හමීඩ් මහතා, නො. 10, ද සිල්වා වීදිය, කළුතර දකුණ, කළුතර | කුඩා පයියාගල හරක් මස් කඩය ... | හරක් මස් විකිණීම |

ම. බ. හේරත්,
පයියාගල් සහ මග්ගොන් බද්ද ගම ප්‍රදේශයේ
පාලන නිලධාරි.

පයියාගල් සහ මග්ගොන් බද්ද ගම ප්‍රදේශයේ
පාලන නිලධාරි කාර්යාලය,
1974 දෙසැම්බර් මස 13 වන දින, පයියාගල දීය.

1–24—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ උතුර ගම්සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවද ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ උතුර ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (257 අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| (1) එස්. හසන්, අංක 105, පිහිලියංග, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 1, මැණික්හින්න මස් කඩය |
| (2) ඇම්. ඇම්. ඉක්බාල්, මඩවල, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 2, මැණික්හින්න මස් කඩය |
| (3) එච්. එම්. තව්පික්, අංක 51/1, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 1, මඩවල මස් කඩය |
| (4) ඇම්. ඒ. මුනාජ්, අංක 20 බී, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 2, මඩවල මස් කඩය |
| (5) ඒ. එච්. එම්. පායිස්, මඩවල, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 3, මඩවල මස් කඩය |
| (6) අයි. බුහාරි, අංක 105, පිහිලියංග, මඩවල කඩවීදිය ... | එළ හරක් මස් ... | අංක 4, මඩවල මස් කඩය |

යූ. පී. වයි. ජිනදාස,
සභාපති,
පාතදුම්බර උඩගම්පහ උතුර ගම්සභාව.

1974 දෙසැම්බර් 17 වැනි දින,
ගම්සභා කාර්යාලය, නාපාන, මැණික්හින්න.

1–42—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### විශෙෂ කොමසාරිස් කාර්යාලය—ගම්පොල නගරය

මෙහි පහත සඳහන් උපලේඛණයෙහි දක්වෙන අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1975 වර්ෂයේ ගෝඝාතක බලපත් ඉල්ලා මා වෙත ඉදිරිපත් කර ඇති බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන ගම්පොල නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වනුයේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

#### උප ලේඛණය

| | ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් | ස්ථානයේ නම |
|---|---|---|
| 1. | එස්. එම්. කාමිල්, 86/1, ඉල්ලවතුර, ගම්පොල ... | ... අංක 10, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 2. | වයි. එම්. හුසේන්, 93, අඹගමුව පාර, ගම්පොල ... | ... අංක 11, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 3. | එම්. එම්. සියාඩ්, 5, නුවර පාර, ගම්පොල ... | ... අංක 12, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 4. | ඒ. එම්. සරුක්, හුනුගල්වත්ත, උනම්බුව, ගම්පොල ... | ... අංක 13, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 5. | එස්. එම්. එස්. ඩීන්, 3, නුවර පාර, ගම්පොල ... | ... අංක 14, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 6. | එම්. ජේ. එම්. ලාපිර්, 14/5, රාජසිංහ පාර, ගම්පොල ... | ... අංක 15, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 7. | එම්. එච්. එම්. මොහොමඩ් ජක්ෂූන්, 15, ඉල්ලවතුර, ගම්පොල | ... අංක 16, හරක් මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 8. | එස්. එම්. එස්. ඩීන්, 3, නුවර පාර, ගම්පොල ... | ... අංක 42, එළු මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 9. | එස්. එම්. කාමිල්, 86/1, ඉල්ලවතුර ... | ... අංක 43, එළු මස් කඩ, පොදු වෙළඳ පොල, ගම්පොල |
| 10. | කේ. මජීඩ්, 235, නුවර පාර, ගම්පොල ... | ... අංක 235, නුවර පාර, ගම්පොල |

ටී. බී. නාරන්පනාවෙ,
විශෙෂ කොමසාරිස්,
ගම්පොල නගරය.

1974 දෙසැම්බර් මස 18 දින,
ගම්පොල නගරයේ විශෙෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–1055—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බේරුවල නගරය

#### 1975 වර්ෂයේ දේපල බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 වෙනි පරිච්ඡේදය)

පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වෙනි පරිච්ඡේදය යටතේ බේරුවල නගරයේ විශේෂ කොමසාරිස් විසින් බේරුවල නගර සභා පාලන සීමාව තුල ඇති සියළුම වංචල දේපල සඳහා 1975 වර්ෂයට වාර්ෂික තක්සේරුවෙන් 12% ක දේපල බද්දක් පැනවී මටත්, එම බදු මුදල්, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දසින් අවසන් වන සමාන කාර්තු 4 කින් අය කරන බවත්, මෙයින් දැනුම් දෙමි. මෙම බද්ද පසුගිය වර්ෂයේ දේපල බද්දට සමානය.

මද්දුම බණ්ඩා හේරත්,
විශෙෂ කොමසාරිස්,
බේරුවල නගරය.

1974 ක්වූ දෙසැම්බර් මස 19 වෙනි දින,
බේරුවල නගරයේ,
විශෙෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–125—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභාව—පනාවල

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 අධිකාරය)

#### 17 ඡේදය යටතේ නියෝග

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 අධිකාරය) 17 (1) ඡේදයේ ප්‍රකාර නිසි බලදරයාවූ කෑගල්ල දිස්ත්‍රික්කයේ පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභාවේ සභාපති තැන්පත් කේ. එච්. ජයසිංහ වන මා වෙත පැවරී තිබෙන බලයේ පරිදි 1975 වර්ෂය තුළදී පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභා සීමාව තුල පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවල දී මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

1975 ජනවාරි 04, 11, 20, 27
1975 පෙබරවාරි 03, 10, 19, 25
1975 මාර්තු 04, 12, 20, 26
1975 අප්‍රේල් 03, 10, 18, 25
1975 මැයි 02, 10, 18, 24, 25
1975 ජූනි 01, 09, 16, 23, 24
1975 ජූලි 01, 08, 15, 22, 31
1975 අගෝස්තු 06, 13, 21, 29
1975 සැප්තැම්බර් 05, 12, 19, 28
1975 ඔක්තෝබර් 04, 11, 19, 27
1975 නොවැම්බර් 02, 10, 18, 26
1975 දෙසැම්බර් 02, 10, 18, 25, 31

කේ. එච්. ජයසිංහ,
පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභාපති.

1974. 12. 23,
පනාවල, ගම්සභා කාර්යාලයේ දීය.

1–127—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### කොස්ලන්ද ගම්සභාව—බදුල්ල දිස්ත්‍රික්කය

#### ගෝඝාතක ආඥාපණත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය එහි සඳහන්කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කොස්ලන්ද ගම්සභා ප්‍රදේශය තුල පදිංචි අයෙක් හෝ සංවිධානයක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතුව සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත දන්වා එවියයුතු බව ගෝඝාතක ආඥාපණතේ (272 වැනි පරිච්ඡේදයේ) 7 (2) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ජේසුදසන්, 97, හපුතල පාර, කොස්ලන්ද | හරක් මස් සහ එළුමස් | කොස්ලන්ද හපුතල මාවතේ, අංක 97 දරණ ස්ථානය |

ඒ. බී. මල්වත්තේගොඩ,
පරිපාලන නිලධාරි, කොස්ලන්ද ගම් ප්‍රදේශය.

කොස්ලන්ද ගම්ප්‍රදේශ කායභාලය,
1974.12.19

1–1066—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### බටහිර කඩවත් කෝරළේ ගම්සභාව–අනුරාධපුර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධව බටහිර කඩවත් කෝරළේ ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින් සිට දින 14 ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරිය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ඇම්. සිරිවර්ධන,
සභාපති,
බටහිර කඩවත් කෝරළේ ගම්සභාව.

1974.12.20 වෙනි දින,
බටහිර කඩවත් කෝරළේ ගම්සභා කාර්යාලයේ දී ය,
මෛත්‍රීපුර, මැදවච්චිය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. ඇම්. විජේසිංහ, මාබෝල, වත්තල | හරක්මස් සහ එළුමස් | මැදවච්චිය, නුවරපාර |
| 2. කේ. ටෙනිසන් පෙරේරා, දුම්රියපල නගරය, මන්නාරම් පාර, මැදවච්චිය | හරක් මස් සහ එළුමස් | දුම්රියපල නගරය, මන්නාරම් පාර |

1–63—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### තුම්පනේ උඩපලාත නැගෙනහිර ගම්සභාව–ගලගෙදර

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පූජ්ඩලු ඔය සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට දින 14 ක් ඇතුළත ලියා මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (257 වැනි අධිකාරියේ) 7 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඒ. අබ්දුල් මජීඩ, දවුලගල, හන්දෙස්ස | අංක 1 ගව මස් වෙළඳ සැළ, ගලගෙදර | ගව මස් |
| යූ. ඇල්. ඒ. ජබාර්, ඒ. ඇල්. ගෆාර් බාරේ, පෙතිගේවෙල පාර, ගලගෙදර | අංක 2 මස් වෙළඳ සැල, ගලගෙදර | ගව මස් |

ඩබ්ලිව්. බී. වැන්කෑව,
සභාපති,
තුම්පනේ උඩපලාත නැගෙනහිර ගම්සභාව.

1–73—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### මැදිරිගිරිය ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය එකී නම් වලට ඉදිරියෙන් දක්වා ඇති ස්ථාන වල මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස, 1975 වර්ෂයට බල පත්‍ර නිකුත් කරන ලෙස මා වෙත අයදුම් කර තිබේ. එම අය වෙත එකී බල පත්‍ර නිකුත් කිරීම පිළිබඳ විරුද්ධතාවයක් දක්වෙන, මැදිරිගිරිය ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට, තමා එසේ විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසාදැයි ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව සකස් කොට, මෙම දැන්වීම ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 අධිකාරය) අංක 7 දරණ වගන්තියේ 2 ඒ සහ බී දරණ උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ විස්තර |
|---|---|---|
| 1. එච්. ඒ. ප්‍රැන්සිස් මහතා ... | ... දියසෙන්පුර සති වෙළඳ පොල කඩ කාමරය | ... එළ හරක් මස් කඩය |
| 2. කේ. ඒ. රහුමාන් මහතා ... | ... මැදිරිගිරිය හන්දිය ... ... | ... එළ හරක් මස් කඩය |

කේ. ඇම්. පොඩිනිළමේ,
සභාපති,
මැදිරිගිරිය ගම් සභාව.

මැදිරිගිරිය ගම් සභා කාර්යාලයය,
දියසෙන් පුර, මැදිරිගිරිය.
1974.12.23 වැනි දින.

1–212.—1975.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### අම්බලන්තොට සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි විස්තර සඳහන් පරිදි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අම්බලන්තොට සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් එය කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින දහහතරක් (14) ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. අයි. කබීර් ... ... | ... අම්බලන්තොට පොදු වෙළඳ පොළ ... | ... එළ හරක් මස් |
| 2. ඒ. අයි. එම්. අලියාර් ... | ... මැලේ කොළනිය ... ... | ... එළ හරක් මස් |
| 3. ඒ. අයි. කබීර් ... ... | ... අම්බලන්තොට පොදු වෙළඳ පොල ... | ... එළු මස් |

ධනපාල ජයසිංහ,
පරිපාලන නිලධාරි,
අම්බලන්තොට නගරය.

1974 දෙසැම්බර් මස 17 වෙනි දින,
අම්බලන්තොට සුළු නගර සභා කාර්යාලයේ දීය.

1–1052.—1975.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය.

### බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

1975 වර්ෂයට සුනඛයින් පිළිබඳ බද්ද

(477 වන අධිකාරය) බල්ලන් ලියා පදිංචි කිරීමේ ආඥපනත

(477 අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර බණ්ඩාරවෙල නගර සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකුටම රු. 1.00ක් සහ සෑම බැල්ලියකටම රු. 1.50ක් බැගින් 1975 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් පනවා ඇති බවත් එකී ගාස්තු 1975 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ශා. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්, බණ්ඩාරවෙල නගරය.

1974 දෙසැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරවෙල, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–36/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

1975 වර්ෂයට රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනත

බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) (255 වන අධිකාරය) වන නගර සභා ආඥපනතේ අංක 162 දරණ වගන්තිය යටතේ, 1974 වර්ෂයේ බල පැවැත්වූ ගාස්තුවලට සමාන බද්දක්, පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1975 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට ද ;

(2) එකී ආඥපනතේ 163 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වන බැව් වේ.

ආර්. සැන්ට්. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්, බණ්ඩාරවෙල නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
බණ්ඩාරවෙල,
974 දෙසැම්බර් මස 19 වැනි දින.
1

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් සඳහා ... ... | 2 | 0 |
| බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහා— | | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දෙයකට යොදනු ලැබේ නම් ... | 1 | 0 |
| කරත්තයක් (සාමාන්‍ය)... ... ... | 1 | 0 |
| අත් කරත්තයක් ... ... ... | 0 | 50 |
| ජින් රික්ෂෝ රථයක් ... ... ... | 1 | 0 |
| අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් ... | 1 | 0 |
| ගොනෙක් හෝ බූරුවෙක් ... ... | 1 | 0 |

1–36/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයන් හි 1975 වර්ෂයට එළගවමස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම පිණිස බලපත්‍ර ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම්සභා ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් සිටින සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දහහතරක් ඇතුළත් මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරය) 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. ඇම්. බී. උඩුරාවන,
සභාපති,
පා. දු. පල්ලේගම්පහ උතුර ගම් සභාව්.

1974 දෙසැම්බර් මස 17 වන දින,
වත්තේගම, යටවර, පා. දු. පල්ලේගම්පහ උතුර ගම්සභා කාර්යාලයේ දීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය |
|---|---|
| 1. ඇන්. ඇල්. ඒ. ලතීප්, අංක 53, පන්විල ... ... | අංක 53, පන්විල. |
| 2. ඇම්. ඇස්. කේ. අලිඋදුමාන්, උඩතලවින්න මඩිගේ, කවුගස් තොට ... ... | ගලහිටවාපු තැන්න |

1–78—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### හෝමාගම සුළු නගර සභාව

සුළු නගර සභා ආඥපනත

1975 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥපනත (256 වෙනි අධිකාරය) යටතේ මෙම ශතවර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු, සුළු නගර සභා ප්‍රදේශය තුළ 1975 වර්ෂයටද එලෙසම පැනවීමට හෝමාගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වෙනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල පිහිටා තිබෙන කුඹුරු හැර අනෙකුත් සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) බැගින් වූ වාර්ෂික බද්ද, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි.

විල්ෆ්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව්.

1974 දෙසැම්බර් මස 18 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

1–1050—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### මාතර නගරය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු—1975

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපණතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වෙනි කොටසේ ප්‍රකාර මාතර නගර සීමාව තුල තබා ගන්නා සෑම බල්ලෙකුට රු. 2.50 ක් හා සෑම බැල්ලෙකටම රු. 5.00 බැගින් 1975 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්, මාතර නගරය.

1974.12.17
මාතර නගරයේ, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1–1087—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

## දැන්වීමයි

### උඩුනුවර ගහ පළාත උතුර ගම් සභාව

උඩුනුවර ගහ පළාත උතුර ගම් සභාව විසින් ගම්සභා ආඥා පනතේ පනවන ලද අතුරු ව්‍යවස්ථා අනුව මෙහි පහත සඳහන් බදු මුදල් සහ බලපත්‍ර ගාස්තු 1974 වර්ෂයට පනවා අය කිරීමට 1974.11.27 වැනි දින පැවැත්වූ සභාවේ සාමාන්‍ය මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 4/1 අනුව සභා සම්මතකර ගත්බව් ගම්සභා නියෝගවල 4 වැනි කාණ්ඩයේ 8(1) දරණ නියෝගය ප්‍රකාර මහජනයාවෙත වෙත මෙයින් දනුම් දෙමි.

1. තක්සේරු බද්ද : (වරිපනම් බද්ද) දියුණු ප්‍රදේශයන් බවට පත්කරණ ලද සියළුම දේපල (ඉඩම් සහ ගොඩනැගිලි) වලින් වාර්ෂික වටිනාකමින් 6%.

2. අක්කර බද්ද : අක්කර 5 කට හෝ ඊට වඩා වැඩි ඉඩම් වලින්, අක්කරයකින් වාර්ෂිකව රු. 2 බැගින්.

3. රථවාහන හා සත්ව බද්ද : (1) කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයකට රු. 5. (2) ගොන්දෙන්නා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට රු. 4. (3) තනිගොනා බඳින බරබාග, තිරික්කල හෝ අත්කරත්තයකට රු. 2.50. (4) සෑම ජින් රික්ෂෝ රථයකට රු. 2.50. (5) සෑම බයිසිකලයකටම රු. 1. (6) සෑම ඇතෙකුට හෝ අලියෙකුට රු. 10.

4. කැළිකසළ බද්ද : කැළිකසල ඉවත් කිරීමේ ප්‍රදේශයට අයත් සෑම ස්ථානයකින්ම මසකට ශත 50.

5. වෙළඳ බලපත්‍ර ගාස්තු :

| | දියුණු ප්‍රදේශ රු. | | | නොදියුණු ප්‍රදේශ රු. | ශ. |
|---|---|---|---|---|---|
| (1) බේකරියක් පවත්වාගෙන යාම සඳහාවූ බලපත්‍රය | ... 35 | 0 | ... | 25 | 0 |
| (2) බත් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රය | ... 25 | 0 | ... | 15 | 0 |
| (3) තේ කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රය | ... 10 | 0 | ... | 7 | 50 |
| (4) සිල්ලර කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රය | ... 10 | 0 | ... | 7 | 50 |
| (5) බාබර් සාප්පුවක් පවත්වාගෙන යාමට බලපත්‍රය | ... 15 | 0 | ... | 10 | 0 |

(6) රෙස්ටෝරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම ඕනෑම ප්‍රදේශයක රු. 50.

(7) කෘතිම පොහොර හෝ පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම රු. 25.

(8) කිරි පට්ටියක් තබා ගැනීම (දෙනුන් 5 කට අඩු රු. 10, 5 සිට 10 රු. 25 හා ඊට වැඩි රු. 50.

(9) බීඩි සෑදීම රු. 20 (10) තේ කර්මාන්තශාලාවකට රු. 250 (11) හාල් හෝ මිරිස් මෝලකට රු. 20 (12) ගඩොල් හෝ උළු පිළිස්සීම රු. 35 (13) හුණු ගබඩා කිරීම රු. 10 (14) හුණු පෝරණුවක් තබා ගැනීම රු. 35 (15) ගෘහ භාණ්ඩ සෑදීම හා විකිණීම රු. 15 (16) මුද්‍රණාලයක් තබා ගැනීම රු. 100 (17) සබන් සෑදීම රු. 25 (18) පප්ඩම් සෑදීම රු. 25 (19) එළවළු හෝ පළතුරු කඩයකට රු. 5 (20) මෝටර් ගරාජයක් තබා ගැනීම රු. 50 (21) රස කැවිලි සෑදීම රු. 25 (22) ලී මඩුවක් තබා ගැනීම රු. 50 (23) කම්මලක් තබාගැනීම රු. 5. (24) පැට්රල්, ඩීසල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ග ගබඩා කිරීම රු. 50 (25) දර මඩුවක් තබාගැනීම රු. 15 (26) පෙට්ටිමඩුවක් තබාගැනීම රු. 25 (27) කුකුල් ගාලක් තබාගැනීම 50 සිට 100 දක්වා රු. 15, 101 සිට 200 දක්වා රු. 35, 201 සිට 500 දක්වා රු. 50, 500 සිට ඉහළට රු. 100 (28) ඌරන්, එලුවන් හෝ විකිණිය හැකි වෙනත් සතුන් ඇතිකිරීම 5 සිට 10 දක්වා රු. 25, 11 සිට 25 දක්වා රු. 50, 25 සිට ඉහළට රු. 100 (29) ගඩොල්, බොරලු හෝ කලුගල් කැඩීම යන්ත්‍රානුසාරයෙන්වූ විට රු. 100, යන්ත්‍රයකින් නොවන විට රු. 75 (30) මාලු විකිණීම රු. 25 (31) ජාඩි හෝ කරවල ගබඩා කිරීම රු. 25 (32) ගුවන්විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම රු. 35 (33) ලී ඉරන ස්ථානයක් තබාගැනීම යන්ත්‍රානුසාරයෙන් රු. 100, එසේ නොමැතිව රු. 25 (34) ලොන්ඩරියක් තබාගැනීම රු. 20 (35) හොන්ඩරයකට වඩා තේ ගබඩා කිරීම රු. 35 (36) හම් පදම්කිරීම හෝ සපත්තු නිපදවීම හෝ අලුත් වැඩියා කිරීම රු. 35 (37) සිමෙන්ති හොන්ඩර 5 වඩා ගබඩා කිරීම (විකිණීම සඳහා) රු. 20.

ඩී. ජේ. විමලරත්න,
සභාපතිතැන,
උඩුනුවර ගහපළාත උතුර ග/ස.

උඩුනුවර හහපළාත උතුර ගම්සභා කාර්‍යාලයේදීය,
කොස්සින්න, ගෙලිඔය,
1974 නොවැම්බර් මස 28 දින.

1–35/1—75.01.03 දින අංක 145 දරණ හැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩන්ගස්ලන්ද ගම් සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන දෙඩන්ගස්ලන්ද ගම් ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණය නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇස්. ඩී. ඇම්. ස්මායිල්, 92/5, විල්ගොඩ, කුරුණෑගල ... | ලිඹිවැහැර කොළණියට හැරෙන හංදියේ ... | එළ හරක් මස් |

කේ. ඩී. ඇස්. ජයවර්ධන,
දෙඩන්ගස්ලන්ද ගම් සභාවේ පාලන නිලධාරි.

1974.12.16 වෙනි දින,
දෙඩන්ගස්ලන්ද ගම් සභා කාර්යාලයේ දීය.

1–1071—1975.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය.

---

### කුම්පනේ උඩපළාත බටහිර ගම් සභාව–අලුදෙනිය—මහනුවර දිස්ත්‍රික්කය

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ දී 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා බල පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කුම්පනේ උඩපලාත බටහිර ගම් සභා ප්‍රදේශයේ ගම් සභාව සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. ඇම්. සප්වාන්, කදුරුඅංග, වැළඩ ... | ... බෙට්ටියගොඩ ... ... | ... හරක් මස් |

කේ. ඇම්. රාජපක්ෂ,
කුම්පනේ උඩපළාත බටහිර ගම් සභාවේ සභාපති තැන.

1974 දෙසැම්බර් මස 20 වැනි දින,
අලුදෙනිය,
කුම්පනේ උඩපළාත බටහිර ගම් සභා කාර්‍යාලයේ දීය.

1–25—1975.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය.

### රාගම සුලු නගර සභාව

### 1975 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනතේ 256 වැනි අධිකාරය යටතේ ගතවීයන අවුරුද්දට බලපවත්නා, පහත සඳහන් වරිපනම් බදු 1975 වර්ෂයට ද එලෙසම පැනවීමට, රාගම සුලු නගර සභාව තිරණයකර ඇති බැව් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුලු නගර සභා සීමාවතුල පිහිටා තිබෙන කුඹුරු හැර සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4%) බැගින් වාර්ෂික බද්ද, පිළිවෙලින්, මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ෂෙල්ටන් පී. අමරසේකර,
සභාපති,
රාගම, සුලු නගර සභාව.

1974.12.17 දින,
රාගම, සුළු නගර සභා කාර්යාලයේදීය.

1-27—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1975 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 වගන්තිය අනුව පහත සඳහන් උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1975 වර්ෂයට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා ඇති බවත්,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1975 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

#### උපලේඛනය

| | | රු. | ශ. |
|---|---|---|---|
| සෑම පා පැදියක් සඳහා | ... ... | 1 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | ... ... | 1 | 50 |
| ගොන් දෙන්නා බඳින සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... ... | 3 | 0 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා | ... ... | 2 | 0 |
| සෑම ගොනෙකු සඳහා | ... ... | 1 | 0 |

පී. මාකස් ඩයස්,
සභාපති,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 18 දින,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභා කාර්යාලයේ දිය.

1-39/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1975 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 අධිකාරය) යටතේ ගත වී යන 1974 වර්ෂයට බල පවත්නා පහත සඳහන් වරිපනම් බදු 1975 වර්ෂයට ද එලෙසම පැනවීමට බත්තරමුල්ල-තලංගම සුළු ගර සභාව තිරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වන වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටි කුඹුරු හැර අන්, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට 5 බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැක.

පී. මාකස් ඩයස්,
සභාපති,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 18 දින,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභා කාර්යාලයය,
බත්තරමුල්ල.

1-39/2—70.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1975 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වැනි කොටසේ ප්‍රකාර බත්තරමුල්ල-තලංගම සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙක් වෙනුවෙන්ම රු. 1 ක් ද, බැල්ලක් වෙනුවෙන් රු. 1.50 ක් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු විශයෙන් 1974 වර්ෂයේ දී මෙන් ම 1975 වර්ෂයේ දී ද පනවා ඇති බවත්, එකී ගාස්තු 1975 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දන්වමි.

පී. මාකස් ඩයස්,
සභාපති,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 18 දින,
බත්තරමුල්ල-තලංගම සුළු නගර සභා කාර්යාලයය,
බත්තරමුල්ල.

1-39/3—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල නගරය

### නගර සභා ආඥාපනත

### 1975 වර්ෂය සඳහා දේපල බද්ද

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරිය යටතේ මෙම ගතවී යන 1974 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1975 වර්ෂයටද එලෙසම පැනවීමට බණ්ඩාරවෙල නගරයේ විශේෂ කොමසාරිස් වන මම මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර බණ්ඩාරවෙල නගරය තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමෙන් සියයට 11 බැගින් වාර්ෂික බදු, පිළිවෙලින් මාර්තු 31 වන දයින්, ජූනි 30 වන දායින්, සැප්තැම්බර් 31 වන දයින් හා දෙසැම්බර් 31 වන දායින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ආර්. සැන්ඩි. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්, බණ්ඩාරවෙල නගරය.

1974 දෙසැම්බර් මස 19 වැනි දින,
බණ්ඩාරවෙල, විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

1-38—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### පුත්තලම සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
(272 වන අධිකාරිය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 71(1) දරන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැන වූද, පුත්තලම සුළු නගර සභාවේ සභාපති තැන වූ ද, ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි වන මම, 1975 වර්ෂයේදී පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් දින වලදී පුත්තලම සුළු නගර සභා සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

### උපලේඛනය

1975 ජනවාරි මස 27 දින (පසලොස්වක පෝය)
1975 පෙබරවාරි මස 25 දින (පසලොස්වක පෝය)
1975 මාර්තු මස 26 දින (පසලොස්වක පෝය)
1975 අප්‍රේල් මස 25 දින (පසලොස්වක පෝය)
1975 මැයි මස 24 දින (පසලොස්වක පෝය)
1975 මැයි මස 25 දින (වෙසක් පොහෝ දිනට පසු දින)
1975 ජූනි මස 23 දින (පසලොස්වක පෝය)
1975 ජූලි මස 22 දින (පසලොස්වක පෝය)
1975 අගෝස්තු මස 21 දින (පසලොස්වක පෝය)
1975 සැප්තැම්බර් මස 19 දින (පසලොස්වක පෝය)
1975 ඔක්තෝබර් මස 4 දින (ලෝක සත්ව දිනය)
1975 ඔක්තෝබර් මස 19 දින (පසලොස්වක පෝය)
1975 නොවැම්බර් මස 18 දින (පසලොස්වක පෝය)
1975 දෙසැම්බර් මස 18 දින (පසලොස්වක පෝය)

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුත්තලම සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 23 දින,
පුත්තලම සුළු නගර සභා කාර්යාලයේදීය.

1-141—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා.

4. මුදල් ගණු දෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනී ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් කර එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ලංකාවේ අණපනත් යටතේ නීතියක් කළායයි කියැවෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... .. | 20 | 0 |
| මැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... .. | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අනුව ඇතිවෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම සඳහන් දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු *—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.

* තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

1975

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 75.01.03 | සිකුරාද | 74.12.27 | සිකුරාද | දවල් 12.00 |
| | 75.01.10 | සිකුරාද | 75.01.03 | සිකුරාද | දවල් 12.00 |
| | 75.01.17 | සිකුරාද | 75.01.10 | සිකුරාද | දවල් 12.00 |
| | 75.01.24 | සිකුරාද | 75.01.17 | සිකුරාද | දවල් 12.00 |
| | 75.01.31 | සිකුරාද | 75.01.24 | සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | 75.02.07 | සිකුරාද | 75.01.31 | සිකුරාද | දවල් 12.00 |
| | 75.02.14 | සිකුරාද | 75.02.07 | සිකුරාද | දවල් 12.00 |
| | 75.02.21 | සිකුරාද | 75.02.14 | සිකුරාද | දවල් 12.00 |
| | 75.02.28 | සිකුරාද | 75.02.21 | සිකුරාද | දවල් 12.00 |
| මාර්තු | 75.03.07 | සිකුරාද | 75.02.28 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.14 | සිකුරාද | 75.03.07 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.21 | සිකුරාද | 75.03.14 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.27 | බ්‍රහස්පතින්ද | 75.03.21 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | 75.04.04 | සිකුරාද | 75.03.27 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.04.11 | සිකුරාද | 75.04.04 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.18 | සිකුරාද | 75.04.11 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.24 | බ්‍රහස්පතින්ද | 75.04.18 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | 75.05.02 | සිකුරාද | 75.04.24 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.05.09 | සිකුරාද | 75.05.02 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.16 | සිකුරාද | 75.05.09 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.23 | සිකුරාද | 75.05.16 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.30 | සිකුරාද | 75.05.23 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 75.06.06 | සිකුරාද | 75.05.30 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.13 | සිකුරාද | 75.06.06 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.20 | සිකුරාද | 75.06.13 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.27 | සිකුරාද | 75.06.20 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි